
# මිමියි කිටියයි

එම්. ඔෂේන්යා වුනාරා පීරිස්




කතෘ ප්‍රකාශනයකි.

ISBN 978-624-206-895-4

එම්. ඔෂේන්‍යා චුනාරා පීරිස්
2 වසර ඊ
මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර
2023 ඔක්. 23

කතෘගේ වෙනත් කෘති

The Red Bug Car



## පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ
ගරු විදුහල්පතිනියට
සහ
මාගේ පන්තිභාර ගුරුතුමිය වන
චාමිනී පල්ලියගුරු ගුරුමෑණියන්ට.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසි යකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කර ඒ තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමකු රීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂ ණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් “ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදිදරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතවුන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකිනි දරුවන් සහෝදරත්ව් යෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතයි තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01

එදා පෝය දවසක්
අපි හැමෝම පන්සල් යන්න
සූදානම් වුනා.
මමයි අයියයි මල් කැඩුවා.

අපි දෙන්නා අම්මා පස්සෙන්
පන්සලට ගියා.
එදා හරිම ලස්සනට හඳ මාමා
අපි දිහා බලාගෙන හිටියා.





මම බෝමළුව අතුගානකොට
පූස්පැටියෙක්
ඉදලේ පැටලි පැටලී
සෙල්ලමට ආවා.

මම උඹ දිහා බැලුවා.
උඹ මට කඳාවි කිව්වා.



අපි ආපහු ගෙදර එනකොට
පූස්පැටියා අපේ පස්සෙන්
එන්න පටන් ගත්තා.
අපිට දුක හිතුනා.





අපි ඒ පූස්පැටියාව ගෙදර
ගෙනාවා.


අද ඉදන් ඔයාගේ නම "කිටී"
හරිද? මම කව්වා.



කිටීයාගේ ඇගේ තුවාල තිබ්බා, අපි බෙහෙත් දැම්මා කෑම කන්නත් දුන්නා.

දැන් කිටීයා හරිම දඟයි මාත් එක්ක සෙල්ලම් කරනවා. පොත් වල වැඩ කරනකොට කිටී ඉන්නේ මගේ පාඩම් මේසේ උඩ.

අපි කිටීට හරිම ආදරෙයි.
කිටීත් අපිට ආදරෙයි.






දවසක් අපි ඉස්කෝලේ ගිහින්
එනකොට වෙනදා වගේ
කිටී දුවගෙන ආවේ නෑ.
කෑදාවී කිව්වෙත් නෑ.
මමයි අයියයි අම්මයි හැම තැනම
බැලුවා. කිටීව හෙව්වා.

අපි වත්ත පහලට ගියා කෑගහලා
කිටීට කතා කරා "අනේ උඹ නෑ".



එක පාරටම අයියා
කිවුවා "ඔන්න කිටීයා
කෑගහනවා",
අපි හොදට අහගෙන
හිටියා. ඇතින්
ඇහෙනවා කිටීයා
කෑගහනවා.

බලනකොට
කිටියා ඉන්නවා
කොස් ගහ
උඩටම නැගලා ඉතින් කොහොමද
පහලට ගන්නේ?



අපි තුන්දෙනාට හරි ප්‍රශ්නයක්
තාත්තා එන්නත් රෑ වෙනවා.

අයියා දුවලා ගියා ටිකිරි මාමාලගේ
ගෙදර. ටිකිරි මාමාව කතා කරගෙන
එන්න.



මම හොඳටම ඇඬුවා. මම හිතුවා
ආයෙත් මගේ කිටියාව ලැබෙන
එකක් නෑ කියලා.

ටිකිරි මාමා ගහ උඩටම නැග්ගා.
කිටියා ළඟටම ගියා.
ටිකිරි මාමාගේ කරේ තියෙන
තුවායෙන් කිටියාව ඔතා ගත්තා.






දැන් කිට්ටියාට හෙල්ලෙන්න බෑ,
ටිකිරි මාමා හිමීට කිට්ටියාව
අරගෙන පහලට බැස්සා.
කිට්ටියාව මගේ අතට දුන්නා.

"මෙන්න දෝණිගේ පූස් පැටියා",
කිට්ටියා බයවෙලා මට තුරුල්වෙලා
ගුලිවෙලා හිටියා. ටිකිරි මාමා
වීරයෙක් මට හිතුනා.

"ආයෙත් නැගගත්තොත් නේ ගස් උඩ",
අම්මා කිට්ටියාට බැන්නා. ඒ විහිළුවට.






අපි හැමෝම සතුටින් ගෙදර ගියා.
මම කිටියාට ආදරෙයි. කිටියත් මට ආදරෙයි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .



මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01